# සුවෙන් පෙරට
# e ඉගෙනුම් පියස
# මිනුවන්ගොඩ

- ශ්‍රේණිය - 10
- විෂයය - ඉතිහාසය
- පාඩම - 08 - මහනුවර රාජධානිය (2 කොටස )


- සැකසුම - තමාලි පෙරේරා
නියෝජ්‍ය විදුහල්පති
මිනු/ බලබෝව කණිෂ්ඨ විද්‍යාලය

# මහනුවර රාජධානිය
# 2 කොටස



## ❑ මහනුවර රාජධානියේ පරිපාලන සංවිධානය



- ❖ ඉහළම නිලධාරියා රජතුමාය
- ❖ රජුගේ සභායට මහාධිකාරම්වරු දෙදෙනෙක් විය
- ❖ රජුගේ ප්‍රධානත්වයෙන් රාජ්‍යයේ වැදගත් කටයුතු සාකච්ඡා කිරීමට රාජ සභාවක් විය

## ❑ රාජධානියේ පරිපාලන කටයුතු අංශ කිහිපයකට බෙදා තිබුණි

- ❖ මහ වාසල
- ❖ රට වසම
- ❖ මහ බද්ද
- ❖ විහාරගම් හා දේවාලගම්

## ❖ රජුගේ බලය

- රටේ ඉහළම බලය හිමි තැනැත්තා වේ
- රටේ සාමය පවත්වාගෙන යාම හා ආරක්ෂාව සැලසීම ප්‍රධාන කාර්යයන් වේ
- පෙර සිරිතට හා සම්ප්‍රදායට අනුව කටයුතු කළ යුතු විය
- රටේ ඉහළම අධිකරණ බලය රජුට හිමි විය
- වරදකරුවකුට මරණ දණ්ඩනය පැනවීමේ බලය රජු සතු විය



## ❖ මහ අධිකාරම්වරු

- මහ අධිකාරම් තනතුරු දෙකකි

**මහ අධිකාරම් - පල්ලෙගම්පහ මහඅධිකාරම්**

**දෙවන අධිකාරම් - උඩගම්පහ මහඅධිකාරම්**


- මහ අධිකාරම්වරුන්ගේ පණිවිඩ පහළ නිලධාරීන් කරා ගෙන ගිය පිරිස **කටුපුල්ලේ පණිවිඩකරුවන්** නම් වේ




## ❑ මහ වාසල නිලධාරීන්

රජ තනතුරේ ගාම්භීරත්වය රැකගෙන රජවාසල කටයුතු පවත්වාගෙන යාම මෙම නිලධාරීන්ට භාර විය

- ඇතුන් භාරව කටයුතු කරන්නා - ගජනායක නිලමේ
- රජුගේ ලේකම්වරයා - මහලේකම්
- රාජකීය භාණ්ඩාගාරය භාර නිලධාරියා - මහ ගබඩා නිලමේ
- රාජකීය මුලුතැන්ගෙය භාර නිලධාරියා - බත්වඩන නිලමේ
- රාජකීය සළුපිළි සපයන නිලධාරියා - හළුවඩන නිලමේ



# රටවසම හෙවත් ප්‍රාදේශීය පාලනය



## ❑ බද්දෙ සංවිධානය

- මඩිගෙ බද්ද - ප්‍රවාහන කටයුතු
- කුරුවේ බද්ද - ඇතුන් ඇල්ලීම
- බඩහැල බද්ද - වළං තැනීම
- රදා බද්ද - රෙදි සේදීම
- හැඳ බද්ද - රෙදි විවීම



## ❑ විහාරගම් හා දේවාලගම්

- විහාරාරාම පාලන කටයුතු
  - මහනායක හා අනුනායක හිමිවරු යටතේ සිදුවිය
- දළදා මාළිගාවේ කටයුතු
  - දියවඩන නිලමේතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුවිය



## ➢ අධිකරණ කටයුතු

- ඉහළම අධිකරණ නිලධාරියා රජු විය
- සෑම නිලධාරියෙකුටම තම පදවිය අනුව අධිකරණ බලතල හිමි විය


## ➢ රජු විසින්ම විසඳන ලද නඩු

- වැදගත් නායකයින් සම්බන්ධ නඩු
- රාජ ද්‍රෝහීත්වය පිළිබඳ නඩු
- කැරලි කෝලාහල පිළිබඳ නඩු
- විහාර හා භික්ෂූන් සම්බන්ධ නඩු
- කුමන්ත්‍රණ නඩු



## ➢ වැරදිකරුවන්ට ලබා දුන් දඬුවම්

- අතුල් පහර දීම
- දඬ ගැසීම
- දඬුකඳේ ගැසීම
- ඇතුන් ලවා පාගා මැරීම
- කස පහර දීම
- ඉපලෙන් තැලීම
- දඟගෙයි ලෑම
- පිටුවහල් කිරීම
- රොඩී රැහැට දැමීම
- හිස කෙස් කැපීම
- දියේ ගිල්වා මැරීම



## ❖ උඩරට ආර්ථිකය


1. කෘෂිකර්මාන්තය
   - වී වගාව
   - හේන් වගාව
   - ගෙවතු වගාව




හෙල්මලු ක්‍රමය

## 2.සත්ත්ව පාලනය

- මී ගවයන් කෘෂිකර්මාන්තයේ දී සහාය පිණිසත්
- එළ ගවයින් කිරි පිණිසත් ඇති කරන ලදී





## 3.වෙළඳාම

- දේශීය - භාණ්ඩ හුවමාරුව මත සිදුවිය
- විදේශීය - රජුගේ ඒකාධිකාරය මත සිදුවිය



## 4. වෙනත් කර්මාන්ත


- යකඩ කර්මාන්තය
- පන් කර්මාන්තය
- දැව කර්මාන්තය
- ලෝහ කර්මාන්තය
- ලාක්ෂා කර්මාන්තය





## ➢ උඩරට සමාජ සංවිධානය

- රටේ සියලු ඉඩම්වල හිමිකරුවා රජු විය
- ඉඩම්වල අයිතිය හා භුක්තිය පදනම් කරගෙන කොටස් කිහිපයකට බෙදේ




- ✓ ගබඩාගම් - රජවාසල ප්‍රයෝජනය සඳහා වෙන් වූ ඉඩම්
- ✓ නින්දගම් - රදළ ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් ප්‍රදානය කළ ඉඩම්
- ✓ විහාරගම් - විහාරාරාම සඳහා පූජා කළ ඉඩම්
- ✓ දේවාලගම් - දේවාල සඳහා පූජා කළ ඉඩම්
- ✓ පරවේණි ගම් - ගම්වැසියන් පරම්පරාගතව භුක්ති විඳි ඉඩම්



# ❖ සමාජ ලක්ෂණ

- මහනුවර රාජධානියේ පැවැතියේ ග්‍රාමීය සමාජයකි
- සමාජ සම්බන්ධතා කුල ක්‍රමය මත පදනම් විය
- ආවාහ විවාහ කටයුතු කුලය පදනම් කරගෙන සිදු කෙරිණි
- විවාහ ක්‍රම තුනකි
  - ❖ දීග විවාහය
  - ❖ බින්න විවාහය
  - ❖ එකගෙයි කෑම
- සියලු කටයුතු අත්තම් ක්‍රමයට සිදුවිය
- පවුල ප්‍රධාන සමාජ ඒකකය විය
- ගුණගරුකබව සමාජයේ ප්‍රකට ලක්ෂණයක් විය
- පන්සල ගැමි දිවිය හා බැඳුණු මධ්‍යස්ථානය විය



ස්තූතියි!

තමාලි පෙරේරා